# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 ජූලි මස 26 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.07.26 දින නිකුත් කරන ලදී)

## ප්‍රාථමික අධිකරණ නඩු විධාන (සංශෝධන)

**1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් 68 වන හෝ 69 වන වගන්තිය යටතේ ලබාදුන් යම් ආඥාවක්, ආරාවුලට සම්බන්ධ පාර්ශ්වයක හිමිකමකට හෝ සම්බන්ධතාවයකට අදාළ වන බවටත්, එය දිසාධිකරණය මගින් විනිශ්චයට භාජනය කිරීම සුදුසු වන බවටත් ඔහුගේ මතය වන අවස්ථාවක දී, එම ආඥාවෙහි නඩු වාර්තාව අදාළ දිසා අධිකරණය වෙත යොමු කිරීමට ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාට විධිවිධාන සැලසීම පිණිස, මේ වගන්තිය මගින්, 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතට, 70අ සහ 70ආ අලුත් වගන්ති ඇතුළත් කරනු ලබයි.

# ප්‍රාථමික අධිකරණ නඩු විධාන
# (සංශෝධන)

එල්. ඩී.- ඕ. 27/2024

**1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** (1) මේ පනත 2024 අංක       දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 44 දරන පනතට 70අ සහ 70ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම

**2.** 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 70 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 70අ සහ 70ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

"නඩු වාර්තා දිසා අධිකරණය වෙත යොමු කිරීම

70අ. (1) ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, 68 වන වගන්තිය හෝ 69 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන අවස්ථාවේ දී-

(අ) 66 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ආරාවුලට සම්බන්ධ යම් පාර්ශ්වකරුවකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ; හෝ

(ආ) ආරාවුලට අදාළ කරුණ පාර්ශ්වකරුවකුගේ හිමිකමට හෝ සම්බන්ධතාවකට අදාළ බව ද එය දිසා අධිකරණයක් විසින් විනිශ්චය කිරීම උචිත බව ද ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක,

ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, ආඥාවේ පිටපතක් තබා ගන්නා අතර ම, ආඥාවේ දිනෙන් එක් මාසයක් ඇතුළත, ආරාවුලට අදාළ ඉඩම හෝ එම ඉඩමෙහි අයිතිවාසිකම හෝ සම්බන්ධතාව පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත නඩු වාර්තාව යොමු කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(2) නඩු වාර්තාව දිසා අධිකරණය වෙත යොමු කිරීමේ ආඥාවක් නොතකා, ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, තමා විසින් කරන ලද යම් ආඥාවක්, එකී ආඥාවේ දිනෙන් එක් මාසයක් ඇතුළත ක්‍රියාවේ යොදවන ලෙස පාර්ශ්වකරුවන් වෙත විධාන කරනු ලැබිය හැකි අතර, දිසා අධිකරණය විසින් අතුරු හෝ අවසාන යන කවර වූ හෝ ආඥාවක් කරනු ලබන තෙක් යථා තත්ත්වය පවත්වාගෙන යාමට පාර්ශ්වකරුවන් වෙත වැඩිදුර ආඥා කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ යම් ආඥාවකට විරුද්ධව කිසිදු අභියාචනයක් හෝ ප්‍රතිශෝධනයක්, එම ආඥාවට අදාළ නඩු වාර්තාව දිසා අධිකරණය වෙත යොමු කිරීම සඳහා ඔහු විසින් ආඥාවක් කරන ලද දින සිට කරනු නොලැබිය යුතු ය.

දිසා අධිකරණයේ නඩු කටයුතු

70ආ. (1) 70අ වගන්තිය යටතේ නඩු වාර්තාවක් ලැබීමෙන් පසු, දිසා අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් නඩු අංකයක් ලබා දී, එකී ආඥාවේ දිනෙන් එක් මාසයකට පසු නොවන දිනයක දී අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස පාර්ශ්වකරුවන් වෙත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(2) දිසා අධිකරණය විසින්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ XLIII වන පරිච්ඡේදය යටතේ එකී කරුණ සම්බන්ධයෙන් නඩු පවරා ඇත්තාක් මෙන් එකී කරුණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනු ලැබිය යුතු අතර, එහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) දිසා අධිකරණය විසින්, තම හිමිකම් පෑමේ ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස පාර්ශ්වකරුවන් වෙත ආඥා කරනු ලැබිය යුතු ය. දිසා අධිකරණය විසින්, යුක්තියේ අරමුණ සඳහා හෝ අධිකරණ ක්‍රියාවලිය අවභාවිත කිරීම වැළැක්වීම සඳහා එකී එකතු කිරීම අවශ්‍ය විය හැකි බව අධිකරණයේ මතය වන

අවස්ථාවක, ස්වකීය මෙහෙයවීම යටතේ හෝ යම් පාර්ශ්වකරුවකු විසින් එය වෙත කරනු ලබන ඉල්ලීමක් මත හෝ නඩු කටයුත්ත සඳහා වෙනත් යම් පාර්ශ්වකරුවකු එකතු කරනු ලැබිය හැකි ය.

(4) දිසා අධිකරණය විසින්, යම් පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත නැතහොත් ස්වකීය මෙහෙයවීම යටතේ ද, අධිකරණය සෑහීමට පත්වන්නා වූ ද අවස්ථාවක, අවසාන නඩු තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙරාතුව වූ යම් අවස්ථාවක දී 70අ වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් කරනු ලබන යම් ආඥාවක් ඉවත දැමීම, වෙනස් කිරීම, මඳ වශයෙන් වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

(5) එම නඩු කටයුත්තේ දී පැනනගින යම් කරුණක් සඳහා මේ පනතින් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක, ඒ හා සමාන කරුණක් පාලනය වන (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, අදාළ කරුණෙහි දී යුක්තිය සඳහා අවශ්‍ය විය හැකි සුදුසු ගළපා ගැනීම් සහිතව, යොදා ගැනීම සහ අදාළ කර ගැනීම කරනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.